# 9 ශ්‍රේණිය -චිත්‍ර කලාව

නිපුණතාව 6.0 : ආගමික හා සංස්කෘතික අංග, දෙස්, විදෙස් වශයෙන් තෝරාගත් ශිල්පීන්ගේ කලා නිර්මාණ අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනා ගත් කලා නිර්මාණ විචාරශීලී ව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 6.4 : තෝරාගත් ශෛලිගත වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන චිත්‍රමය ගුණාංග රසාස්වාදය කරයි.








# "ශෛලිගත නාටය රස විඳිමු."













## ශෛලිගත නාට්‍යය හැඳින්වීම

නාට්‍ය ධර්මී සහ ලෝක ධර්මී යනුවෙන් ප්‍රධාන නාට්‍ය වර්ග දෙකක් වේ. මේ අතරින් ශෛලිගත නාට්‍යය අයත් වන්නේ නාට්‍ය ධර්මී අතරට ය. එම ශෛලිගත නාට්‍යයක විශේෂ ලක්ෂණ වන්නේ නාට්‍යයට අදාළ සියලු දෙබස්, ගීත සහ රිද්මානුකූල දෙබස් අනුසාරයෙන් යුක්ත වීම සහ නාට්‍යයේ සියලු ම අංග චලනයන් සහ ඇවිදයාම ආදිය සංගීත නාදයට සහ ගීතවලට අනුකූල ව රිද්මානුකූල ව සිදුවීම යි. මනමේ, සිංහබාහු සහ බෙරහඬ වැනි නාට්‍ය නිදසුන් ලෙස හැඳින්විය හැකි ය.








## පසුතල නිර්මාණය

ශෛලිගත නාට්‍යවල දී වේදිකා පසුතලය චාම් සහ සරල බවකින් යුක්ත වේ. විශේෂයෙන් ම මෙහි දී ඒ ඒ අවස්ථාවට උචිත පසුබිම, ගීත ආදියෙන් ප්‍රේක්ෂකයාගේ මනසෙහි මවා දක්වීමක් සිදු කරයි.













## අංග රචනය

ශෛලිගත නාට්‍යක අංග රචනය (වේෂ නිරූපණය ) බහුල ව ම යොදා ගැනේ. ඒ ඒ චරිතයට අදාළ භූමිකාව සහ ගති ලක්ෂණ ඉස්මතු කර ගැනීම සඳහා අවශ්‍ය ආකාරයට මුහුණ පාට කිරීම සහ වෙනත් සලකුණු ඇඳීම මෙන් ම රැවුළු, කොණ්ඩා ආදිය ඇලවීම ආදිය මෙම නාට්‍යවල බහුල ව ම සිදු වේ. සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතය සහ මනමේ නාට්‍යයේ වැදි රජුගේ චරිතය නිදසුන් ලෙස දැක්විය හැකි ය.







## රංග භාණ්ඩ

ශෛලිගත නාට්‍යවල එන විවිධ චරිතවලට අදාළ භූමිකාව ඉස්මතු කරලීම සඳහා රංග භාණ්ඩ අත්‍යවශ්‍ය වේ. එමෙන් ම එයින් නාට්‍යට යම්කිසි අලංකාරයක් ද ගෙන දේ. කඩු, හෙල්ල, තෝමර වැනි දේවල් මෙයට අයත් වේ.












## රංග වස්ත්‍රාභරණ

නාට්‍යට අදාළ චරිතවල භූමිකාව සාර්ථක ව ප්‍රකාශ වීම සඳහාත් නාට්‍යයේ අලංකාරය උදෙසාත් රංග වස්ත්‍රාභරණවලින් මහත් පිටුවහලක් ලැබේ. ඇඳුම්, ඔටුනු, නළල්පට, කර මාල, උර මාල, වළලු, තෝඩු, මුදු, පාද ජාලා, පාද සලං සහ සපත්තු රංග වස්ත්‍රාභරණ ලෙස නම් කළ හැකි ය.




පහත ප්‍රශ්ණ වලට පිලිතුරු ලියන්න.

01. ශෛලිගත වේදිකා නාට්‍යයක විශේෂ ලක්ෂණ විස්තර කර එවැනි නාට්‍ය කිහිපයක් නම් කරන්න.

02. ශෛලිගත වේදිකා නාට්‍යවල දී අංග රචනය භාවිත කරනු ලබන ආකාරය තෝරා ගත් වේදිකා නාට්‍යක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. ශෛලීගත වේදිකා නාට්‍යවල චරිතවලට උචිත ආකාරයට රංග භාණ්ඩ සහ රංග වස්ත්‍රාභරණ යොදාගනු ලබන ආකාරය විස්තර කරන්න.

## පහත වීඩියෝ බලන්න

https://youtu.be/sioOmf886bk

https://youtu.be/wJ2Mi09hGuI

https://youtu.be/8MkbEHFER_I